# ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය

53 A, ඩී.එස්.ෆොන්සේකා පාර, කොළඹ - 05, ශ්‍රී ලංකා

දුරකථන / ෆැක්ස් : 2556629 ඊ-මේල් : slpia@sltnet.lk / slpiaexco@gmail.com වෙබ් අඩවිය : www.slpia.lk


මගේ අංකය : එස්.එල්.පී.අයි.ඒ/බැහැර/26/20 ඔබේ අංකය :

2020.02.06

ගරු ලේකම්තුමා,
ජාතික පොලිස් කොමිෂන් සභාව,
අංක 09 ගොඩනැගිල්ල,
B.M.I.C.H පරිශ්‍රය,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

**සහකාර පොලිස් අධිකාරී තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය.**

**පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය විසින් යොමුකරන ලද 2019.11.04 දිනැති අංක එස්.එල්.පී.අයි.ඒ/බැහැර/221/19 දරන ලිපිය හා බැඳේ.**

ඉහත කරුණ සම්බන්ධව 2020.01.27 වන දින ගරු ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමා සමග පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ නිලධාරීන් හමුවූ අවස්ථාවේදී ද සාකච්ඡාවට බඳුන් වූ අතර, දැනට පවතින පුරප්පාඩු සඳහා ජ්‍යෙෂ්ඨතාවය /කුසලතාවය පදනම මත සහ සීමිත තරග විභාගයක් පවත්වා එම පුරප්පාඩු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කරන බව දැනුම් දෙන ලදී.

ඒ අනුව ආරක්ෂක අමාත්‍යාංශය විසින් ජ්‍යෙෂ්ඨතා පදනම මත සහකාර පොලිස් අධිකාරී තනතුර සඳහා 60 දෙනෙක් බඳවා ගැනීමට සහ සීමිත තරග විභාගයක් පැවැත්වීම මගින් නිලධාරීන් 26 දෙනෙකු සහකාර පොලිස් අධිකාරී තනතුර සඳහා බඳවා ගැනීමට නිර්දේශ කර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ලබා දීමෙන් අනතුරුව 2020.01.30 වන දින රැස්වුණු ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ජ්‍යෙෂ්ඨතාවය / කුසලතාවය පදනම මත සහකාර පොලිස් අධිකාරී තනතුර සඳහා උසස් කිරීමට පමණක් අනුමත කර ඇති බව දැනගන්නට ලැබී ඇත.

දැනට ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරීන් බොහෝමයක් සීමිත තරග විභාගය සඳහා සුදුසුකම් සපුරා සිටින අතර, 2007 වර්ෂයෙන් පසුව සීමිත තරග විභාගයක් මේ වනතුරු පවත්වා නොමැත. එබැවින් එසේ සුදුසුකම් සපුරන ලද නිලධාරීන් හට සහකාර පොලිස් අධිකාරී තනතුර සඳහා උසස්වීමේ අවස්ථාව අහිමිව ඇත.

ඉහත කරුණු සලකාබලා සීමිත තරග විභාගයන් පැවැත්වීම සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

ප්‍රගීත් ප්‍රේමසිරි,
නීතිඥ, නීතිවේදී (ගෞරව),
පොලිස් පරීක්ෂක,
ලේකම්,
පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය.

නීතිඥ ප්‍රගීත් ප්‍රේමසිරි
නීතිවේදී (ගෞරව)
ගරු ලේකම්,
ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය

**අභිමානවත් පොලිසියක් ගොඩනගමු.**